## උතුරු මාර්ග සම්බන්ධකෙරෙන ව්‍යාපෘතිය, අමතර අරමුදල් - පළාත් සංරචකය - 2014

---

උතුරු මාර්ග සම්බන්ධකෙරෙන ව්‍යාපෘතිය, අමතර අරමුදල් - පළාත් සංරචකයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) සහ ආසියානු සංවර්ධන බැංකුව (ආසබැ) අතර 2012 නොවැම්බර් 19 දින එළඹි අංක 2890-එස්ආර්අයි(එස්එෆ්) දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.04 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

### 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

උතුරු මාර්ග සම්බන්ධකෙරෙන ව්‍යාපෘතිය - අමතර අරමුදල් ණය ගිවිසුමට අනුව, උතුරු පළාත් සභාවේ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව සහ උතුරු මැද පළාත් සභාවේ පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වන අතර, පළාත් සභා හා ප්‍රදේශීය සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු වනුයේ, උතුරු පළාත තුළ සහ ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශය සහ දකුණු ප්‍රදේශය අතර මාර්ග සම්බන්ධතාවයන් වැඩිදියුණු කිරීමයි. ව්‍යාපෘතියේ කටයුතු සමන්විත වනුයේ,

<u>ආ කොටස - පුනරුත්ථාපනය හා ප්‍රතිස්ථාපනය</u>

උතුරු පළාතේ පළාත් මාර්ග කිලෝ මීටර් 50 ක් පුනරුත්ථාපනය කිරීම සහ තෝරාගත් පාලම් පුනරුත්ථාපනය සහ / හෝ ප්‍රතිස්ථාපනය කිරීම.

<u>ඇ කොටස - පුනරුත්ථාපනය හා ප්‍රතිස්ථාපනය</u>

උතුරු මැද පළාතේ පළාත් මාර්ග කිලෝ මීටර් 70 ක් පුනරුත්ථාපනය කිරීම සහ තෝරාගත් පාලම් පුනරුත්ථාපනය සහ / හෝ ප්‍රතිස්ථාපනය කිරීම.

ව්‍යාපෘති පරිපාලන අත්පොත අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 4,377 කට සමාන එජඩො මිලියන 33.67 ක් වන අතර, ඉන් රු.මිලියන 3,757 කට සමාන එජඩො මිලියන 28.9 ක් මූල්‍යයනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව (ආසබැ) එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ බදු හා තීරු ගාස්තු සඳහා එජඩො මිලියන 4.77 ක මුදලක් ශ්‍රී ලංකා රජය විසින් සපයනු ඇත. 2013 මැයි 31 දින ව්‍යාපෘතිය එහි කටයුතු ආරම්භ කර තිබුණු අතර, 2018 ජුනි 30 දින වන විට නිම කිරීමට නියමිතය.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදී හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකි වනසේ කළමනාකරණය තීරණය කරන එවැනි අත්‍යාවශ්‍ය අභ්‍යන්තර පාලනයන් ඇතිකිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.4 විගණන විෂය පථය හා මතය සඳහා පදනම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම

පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ.තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ.එම අවදානම් තක්සේරු කිරීම්වලදී , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස වැඩ සටහනේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් වැඩ සටහනේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේ ද යන බව.

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද කාර්යයසාධන වාර්තා සහ වැඩි දියුණු කරන ලද මූල්‍ය වාර්තා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම් සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුනේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුනේ ද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනා ගෙන තිබුණේ ද යන බව.

(උ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර තිබුණේ ද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේ ද යන බව සහ

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේ ද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මාගේ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියා මාර්ගයක් ගෙන තිබූ බව සහ,

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අදහස් දැක්වීම්

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතිය විසින් ක්‍රියාත්මක කරන ලද පැකේජ 5 ක් යටතේ පුනරුත්ථාපනය කරන ලද මාර්ග 7 ක කොන්ත්‍රාත් ගෙවීම් වලට අදාල එකතුව රු. 90,142,929 ක් වූ රඳවා ගැනීම් මුදල් මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරවු කර නොතිබුණි. ඒ හේතුවෙන්, සිදු කරන ලද සිවිල් වැඩවල වටිනාකම එම අගයෙන් අඩුවෙන් දැක්වේ.

(ආ) සමාලෝචිත වර්ෂයේ ව්‍යාපෘතිය විසින් කොන්ත්‍රාත්කරු මාර්ගයෙන් ලබාගන්නා ලද වාහනයේ පිරිවැය වූ රු.මිලියන 17 ක මුදල හා වාහන 2 ක් නඩත්තු කිරීමේ වියදම් වල එකතුව වූ රු.මිලියන 2.14 ක් ව්‍යාපෘතිය විසින් සිදුකරන ලද සිවිල් වැඩ ලෙස පෙන්වා තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යනය, සමාලෝචිත වර්ෂයේ අයවැයගත වෙන්කිරීම් සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2014 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනයට අදාල වැදගත් සංඛ්‍යාලේඛන පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමට අනුව මූල්‍යනය කිරීමට එකඟ වූ අගය | | 2014 වර්ෂය සඳහා අයවැයගත වෙන්කිරීම් | | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | සමාලෝචිත වර්ෂය | | 2014 දෙසැම්බර් 31 දින දක්වා | |
| | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන |
| ආසබැ | 28.90 | 3,757.00 | 16.43 | 2,136.9 | 11.86 | 1,542.06 | 12.90 | 1,677.25 |
| ශ්‍රීලංර | 4.77 | 620.10 | 1.41 | 183.5 | 1.09 | 141.58 | 1.15 | 149.54 |
| එකතුව | 33.67 | 4,377.10 | 17.84 | 2,320.4 | 12.95 | 1,683.64 | 14.05 | 1,826.79 |

**3.2** <u>භෞතික ප්‍රගතිය</u>

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට අනුව අනුරාධපුර දිස්ත්‍රික්කයේ දුර කිලෝමීටර් 75.65 ක් වූ පළාත් මාර්ග 7ක්, කිලිනොච්චි දිස්ත්‍රික්කයේ දුර කිලෝමීටර් 27.21 ක් වූ පළාත් මාර්ග 5 ක් හා මුලතිව් දිස්ත්‍රික්කයේ දුර කිලෝමීටර් 24.49 ක් වූ පළාත් මාර්ග 2 ක්, ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුළ පුනරුත්ථාපනය කිරීමට බලාපොරොත්තු විය. කෙසේ වුවද, 2014 දෙසැම්බර් 31 දිනට අනුරාධපුර දිස්ත්‍රික්කයේ සියලු පළාත් මාර්ග පුනරුත්ථාපනය කිරීමේ සියයට 90 ක භෞතික ප්‍රගතියක් වාර්තා විය. තවද, 2014 දෙසැම්බර් 31 දිනට කිලිනොච්චි හා මුලතිව් දිස්ත්‍රික්කවල පළාත් මාර්ග 3 ක් පුනරුත්ථාපනය කිරීමේ සියයට 45 ක භෞතික ප්‍රගතියක් වාර්තා විය. එම මාර්ග පුනරුත්ථාපන කටයුතුවල භෞතික ප්‍රගතිය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ වී අවුරුදු 1 ½ කට පසු සමාලෝචිත වර්ෂය අවසානයේ කිලිනොච්චි දිස්ත්‍රික්කයේ දුර කිලෝමීටර් 14.76 ක් වූ පළාත් මාර්ග 3 ක් පුනරුත්ථාපනය කිරීමේ කොන්ත්‍රාත්තුව ලබාදී තිබුණි. තවද, මුලතිව් දිස්ත්‍රික්කයේ වට්ටපලෛයි - කප්පයිපිල්ලු - පුදුකුඩුඉරුප්පු මාර්ගය පුනරුත්ථාපනය කිරීමට සුදුසු කොන්ත්‍රාත්කරුවකු තෝරා ගැනීමට ව්‍යාපෘතිය විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) අනුරාධපුර දිස්ත්‍රික්කයේ කිරිගොල්ලෑව - හීරලුගම මාර්ගයේ ස්ථාන කිහිපයකම මාර්ග තලය හා මාර්ග උරහිස්වල පස් පිරවුම් හා තැලීම්වල දුර්වලතාව හේතුවෙන් සේදීගොස් තිබූ බව භෞතික පරීක්ෂාව සිදුකළ නිලධාරීන්ට අනාවරණය විය.

**3.3** <u>කොන්ත්‍රාත් පරිපාලනය</u>

රු.269,462,941 ක් වටිනා කාර්යසාධන හා අත්තිකාරම් බැඳුම්කර සඳහා වටිනාකම රු.19,625,000 ක ඉහළ අගයක් බැංකු ගාස්තු ලෙස ගෙවා තිබූ බව සහ එය අවස්ථානුකූලව ලබා දෙන මුදලක් ලෙස වර්ග කිරීම වෙනුවට එකවර මුදල් ගෙවීමක් ලෙස වර්ග කර තිබූ බව නිරීක්ෂණය විය. ඒ හේතුවෙන් කාර්යසාධන හා අත්තිකාරම් බැඳුම්කර සඳහා සියයට 5 සිට සියයට 10 දක්වා වූ පරාසයක අනුපාතයකින් බැංකු ගාස්තු ලෙස රු. 13,589,029 ක අමතර පිරිවැයක් ව්‍යාපෘතිය දරා තිබුණි.